සමාජ සේවා දෙපාර්තමේන්තුව
சமூக சேவைகள் திணைக்களம்
DEPARTMENT OF SOCIAL SERVICES
ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය
கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை அமைச்சு
Ministry of Rural Development, Social Security and Community Empowerment

"ආන්තිකකරණයට හා අවාසිසහගත තත්ත්වයන්ට පත් වූ සෑම තැනැත්තෙකුම සුරක්ෂිත හා අන්තර්කරණීය සමාජයක අභිමානයෙන් යුතුව ජීවත් වීම සඳහා සවිබලගැන්වීම"
"அனைத்து ஓரங்கட்டப்பட்ட மற்றும் பின்தங்கிய நபர்களினதும் பாதுகாப்பு மற்றும் அவர்களை சமூகத்தில் உள்வாங்கி கண்ணியத்துடன் வாழ வலுவூட்டல்"
"Every marginalized and disadvantaged person empowered to live with dignity in a caring and inclusive society"

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. : SSD/02/07/08/01(III) | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date : 2026.05.19 |

# තනතුරු ඇබෑර්තු

## ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය

## සමාජ සේවා දෙපාර්තමේන්තුව

## පෙර පාසල් ගුරු/ කාර්යාල කාර්ය සහායක/ උපස්ථායක (දෛනික දීමනා ගෙවීමේ පදනම)

සමාජ සේවා දෙපාර්තමේන්තුව යටතේ ගාල්ල දිස්ත්‍රික්කයේ අබාධ සහිත දරුවන් වෙනුවෙන් පිහිටුවීමට නියමිත දිස්ත්‍රික් කුසලතා සංවර්ධන දිවා සුරැකුම් මධ්‍යස්ථානය සඳහා පෙර පාසල් ගුරු තනතුරු 20ක්, කාර්යාල කාර්ය සහායක තනතුරු 02ක් හා උපස්ථායක තනතුරු 13ක් බඳවා ගැනීමට ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. පහත දැක්වෙන ආකෘතිය අනුව සකස් කරන ලද අයදුම්පත් දිස්ත්‍රික් ලේකම්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ගාල්ල ලිපිනයට **2026.06.10** දිනට පෙර ලැබෙන සේ තැපෑලෙන් හෝ ගෙනවිත් භාර දිය යුතුය. අයදුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"පෙර පාසල් ගුරු/ කාර්යාල කාර්ය සහායක/ උපස්ථායක - (දෛනික දීමනා ගෙවීමේ පදනම) තනතුරට බඳවා ගැනීම"** යනුවෙන් සඳහන් කර තිබිය යුතුය. www.galle.dist.gov.lk / www.socialservices.gov.lk වෙබ් අඩවි හරහා ද ආදර්ශ අයදුම්පත හා විස්තර ලබා ගත හැක.

මෙම තනතුරු බඳවා ගැනීම සඳහා වන සුදුසුකම්:-

### 01. පෙර පාසල් ගුරු (තනතුරු 20)

1.1 වයස් සීමාව :-

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවු: 18 ට නොඅඩු සහ 30 ට නොවැඩි විය යුතුයි.

1.2 අධ්‍යාපන සුදුසුකම් :-

(අ) සිංහල හෝ දෙමළ හෝ ඉංග්‍රීසි භාෂාව. ගණිතය සහ තවත් විෂයයන් දෙකකට (02) සම්මාන සාමාර්ථයන් සහිතව **එක් වරකදී** විෂයයන් හයකින් (06) අ.පො.ස. (සා. පෙළ) විභාගය සමත්වී තිබීම.

02 වන මහල, II අදියර, සෙත්සිරිපාය, බත්තරමුල්ල. 02 ஆம் மாடி, கட்டம் II, செத்சிறிபாய, பத்தரமுல்லை. 02nd Floor, Stage II, Sethsiripaya, Battaramulla.
කාර්යාලය / அலுவலகம் / Office: 0112187050, 0112187049
ෆැක්ස් / தொலைநகல் / Fax: 0112186276, 0112186010
ඊ-මේල් / மின்னஞ்சல் / E-Mail: director@socialservices.gov.lk
වෙබ් අඩවිය / இணையத்தளம் / Website: www.socialservices.gov.lk
අධ්‍යක්ෂ / பணிப்பாளர் / Director: 0112187040
අතිරේක අධ්‍යක්ෂ / மேலதிக பணிப்பாளர் / Additional Director: 0112186279
ප්‍රධාන ගණකාධිකාරී / பிரதம கணக்காளர் / Chief Accountant: 0112187059
සහකාර අධ්‍යක්ෂ / உதவிப் பணிப்பாளர் / Assistant Director: 0112187053, 0112186180, 0112187042

(ආ) අ.පො.ස. (උ. පෙළ) විභාගයේදී අවම වශයෙන් එක් විෂයයකින් හෝ (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්වී තිබීම.

1.3 **වෘත්තීය සුදුසුකම්** :-

රජයේ ලියාපදිංචි ආයතනයකින් පෙර පාසල් අධ්‍යාපනය පිළිබඳ මාස 03 කට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතිකයක් ලබා තිබීම.

1.4 **පළපුරුද්ද** :-

තනතුරට අදාළ ක්ෂේත්‍රයේ පළපුරුද්ද විශේෂ සුදුසුකමක් ලෙස සැළකේ.

1.5 **බඳවාගැනීමේ ක්‍රමය** :-

මූලික සුදුසුකම් සපුරන අයදුම්කරුවන් අතරින් පවතින පුරප්පාඩු සංඛ්‍යාව හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී ලබාගන්නා ලකුණු වල කුසලතා අනුපිළිවෙළ අනුව බඳවාගැනිම සිදු කෙරේ.

1.6 **දෛනික දීමනාව** :-

රු. 41,317.00 + රු.17,800.00 (ජීවන වියදම් දීමනාව) /30

1.7 **සේවා කොන්දේසි** :-

මෙම තනතුර තාවකාලික වන අතර දෛනික දීමනා ගෙවීමේ පදනමින් වසරක කාලයක් සඳහා බඳවා ගනු ලැබේ

1.8 **සටහන**

ඉහත සඳහන් සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් පමණක් ඉල්ලුම් කළ යුතු අතර අතර තෝරා ගන්නා අයදුම් කරුවන් මෙම මධ්‍යස්ථානයෙහි පවතින පුරප්පාඩු සඳහා පමණක් බඳවා ගැනේ.

**<u>02. කාර්යාල කාර්ය සහායක (තනතුරු 02)</u>**

2.1 **වයස් සීමාව** :-
අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවු: 18 ට නොඅඩු සහ 45 ට නොවැඩි විය යුතුයි.

2.2 **අධ්‍යාපන සුදුසුකම්** :-

අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයයන් හයක් සමත් වී තිබීම.

2.3. **වෘත්තීය සුදුසුකම්** :-

අදාල නොවේ.

2.4 **පළපුරුද්ද** :-

තනතුරට අදාළ ක්ෂේත්‍රයේ පළපුරුද්ද විශේෂ සුදුසුකමක් ලෙස සැළකේ.

**2.5 බඳවාගැනීමේ ක්‍රමය**:-

මූලික සුදුසුකම් සපුරන අයදුම්කරුවන් අතරින් පවතින පුරප්පාඩු සංඛ්‍යාව හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී ලබාගන්නා ලකුණු වල කුසලතා අනුපිළිවෙළ අනුව බඳවාගැනිම සිදු කෙරේ.

**2.6 දෛනික දීමනාව :-**

රු. 37,725.00 + රු.17,800.00 (ජීවන වියදම් දීමනාව) /30

**2.7 සේවා කොන්දේසි** :-

මෙම තනතුර තාවකාලික වන අතර දෛනික දීමනා ගෙවීමේ පදනමින් වසරක කාලයක් සඳහා බඳවා ගනු ලැබේ.

**2.8 සටහන**

ඉහත සඳහන් සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් පමණක් ඉල්ලුම් කළ යුතු අතර අතර තෝරා ගන්නා අයදුම් කරුවන් මෙම මධ්‍යස්ථානයෙහි පවතින පුරප්පාඩු සඳහා පමණක් බඳවා ගැනේ.

## <u>03. උපස්ථායක (තනතුරු 13)</u>

**3.1 වයස් සීමාව** :-
අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවු: 18 ට නොඅඩු සහ 45 ට නොවැඩි විය යුතුයි.

**3.2 අධ්‍යාපන සුදුසුකම්** :-

අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයයන් හයක් සමත් වී තිබීම.

**3.3. වෘත්තීය සුදුසුකම්** :-

රජයේ රෝහලක, බෙහෙත් ශාලාවක හෝ සෞඛ්‍ය දෙපාර්තමේන්තුව යටතේ ලියාපදිංචි පෞද්ගලික රෝහලක උපස්ථාන කටයුතු සම්බන්ධ පුහුණුවක් ලබා තිබීම. (සහතික මඟින් සනාථ කල යුතුය)

**3.4 පළපුරුද්ද** :-

තනතුරට අදාළ ක්ෂේත්‍රයේ පළපුරුද්ද විශේෂ සුදුසුකමක් ලෙස සැළකේ.

**3.5 බඳවාගැනීමේ ක්‍රමය**:-

මූලික සුදුසුකම් සපුරන අයදුම්කරුවන් අතරින් පවතින පුරප්පාඩු සංඛ්‍යාව හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී ලබාගන්නා ලකුණු වල කුසලතා අනුපිළිවෙළ අනුව බඳවාගැනිම සිදු කෙරේ.

**3.6 දෛනික දීමනාව :-**

රු. 37,725.00 + රු.17,800.00 (ජීවන වියදම් දීමනාව) /30

3.7 **සේවා කොන්දේසි :-**

මෙම තනතුර තාවකාලික වන අතර දෛනික දීමනා ගෙවීමේ පදනමින් වසරක කාලයක් සඳහා බඳවා ගනු ලැබේ.

3.8 **සටහන**

ඉහත සඳහන් සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් පමණක් ඉල්ලුම් කළ යුතු අතර අතර තෝරා ගන්නා අයදුම් කරුවන් මෙම මධ්‍යස්ථානයෙහි පවතින පුරප්පාඩු සඳහා පමණක් බඳවා ගැනේ.

දර්ශනී කරුණාරත්න

2026.05.

සමාජ සේවා අධ්‍යක්ෂ